| | | |
|---|---|---|
| පැමිණිලිකරු | : | ඩී.එස්. චන්ද්‍රසිරි මයා,<br>නො.496/බී,<br>ඉහළ කරගහමුණ,<br>කඩවත. |
| වගඋත්තරකරුවන් | : | සභාපති,<br>ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,<br>තැ.පෙ.56, නො.03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>වැලිකඩ, රාජගිරිය. |

**පැමිණිලි අංක : HRC/2694/19**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකරු සිය පැමිණිල්ල කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් දන්වා සිටිනු ලබන්නේ තමා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ගිණුම් සහකාරවරයකු ලෙස සේවය කරන බවත් 2018.10.14 දින දරණ පුවත්පත් නිවේදනයකට අනුව තරග විභාගයට ඉදිරිපත් වී ලකුණු 64ක් උපයා ගත් බවත්, එසේම සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ බවත්ය. සම්මුඛ පරීක්ෂණයේදී තමා සතු පශ්චාත් උපාධි සුදුසුකම සඳහා නිවැරදිව ලකුණු ලබා නොදුන් බවත්, ඒ සඳහා තමන්ට ලකුණු 02ක් ලබා දුන්නේ නම් සම්මුඛ පරීක්ෂණ ලකුණු 40% ට ගණනය කොට සලකා බැලීමේදී ඒ සඳහා තමාට ලකුණු 3.2ක හිමිකමක් පවතින බවත් නමුත් තමා ඉදිරිපත් කළ සහතික පත්‍රය සඳහා ලකුණු ලබා නොදීම තුලින් තනතුර සඳහා පූර්ණය කළ යුතු සුදුසුකම් සපුරා ලීමට හැකියාව නොවූ බවත් ඒ වනවිට තමාට අදාල පශ්චාත් උපාධිය පිළිබඳව උපාධි සහතිකය ප්‍රධානය කර නොතිබූ බවත් කැලණිය විශ්ව විද්‍යාලයේ විභාග අංශය මගින් නිකුත් කළ තමා පශ්චාත් උපාධිය සමත් බවට වන සියළු තොරතුරු ඇතුලත් සහතිකය ඉදිරිපත් කළ බවත්, කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවයේදී ලබා දෙනු ලබන සහතිකය ඉදිරිපත් නොකිරීම යන කාරණය මත තමාට ලකුණු




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

ලබා නොදුන් බව සඳහන් කොට ඇත. නමුත් කැලණිය විශ්ව විද්‍යාලය විසින් ලබා දෙනු ලැබූ සහතිකයෙහි තමා හදාරණු ලැබූ සියළු විෂයන් සහ සාමාර්ථයන් පිළිබඳවද ඒ අදාල උපාධි ප්‍රධානෝත්සවයේදී ලබා දෙනු ලබන අවසාන සහතික පත්‍රයේ ඇතුලත් වියයුතු සියළු කරුණු ඇතුලත්ව තිබූ බවද සඳහන් කර සිටි. ඒ අනුව සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය විසින් අදාල සහතිකයට ලකුණු ලබා නොදීම තුලින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට පැමිණිල්ල මගින් ඉදිරිපත් කර සිටි.

## වගඋත්තකරුගේ කරුණු සැලකිරිම.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරිමේ සංස්ථාවේ ගණකාධිකාරි ii ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනිම සඳහා බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති බවත් එම පුවත්පත් දැන්වීමට අනුව ඉදිරිපත් වූ අයදුම්පත් වලින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා තරග විභාගයක් පවත්වන ලද අතර, එම තරග විභාගයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට තෝරාගත් අතර, ඒ සඳහා බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් 14 දෙනකු තෝරා ගත් බවත්, එම 14 දෙනා අතුරින් විභාගයෙන් ලබා ගත් ලකුණු වලින් 60% ක ප්‍රතිශතයක්ද සම්මුඛ පරීක්‍ෂණයෙන් ලබා ගත් ලකුණු වලින් 40% ක ප්‍රතිශතයක්ද සලකන ලද බවත්, එම ලකුණු වල එකතුවෙන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය මත පදනම්ව අයදුම්කරුවන් තිදෙනෙකු තෝරාගත් බවත් මෙම පැමිණිලිකරු ලබා ගත් ලකුණු පිළිවෙල මත හතරවන ස්ථානයට පත්ව ඇති බවයි. පැමිණිලිකරු සඳහන් කරන ආකාරයට ඔහු සම්මුඛ පරීක්‍ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගෙන නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සම්මුඛ පරීක්‍ෂණයේදී අපේක්‍ෂකයන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්‍ෂා කර ඇති බවත් පැමිණිලිකරු තම අධ්‍යාපන සහතික අතරින් කැලණිය විශ්ව විද්‍යාලයෙන් නිකුත් කරන ලද 2018.09.04 දිනැති ප්‍රතිඵල සටහනක් ඉදිරිපත් කර ඇති බවයි. තවද පැමිණිලිකරු අදාල උපාධි සහතිකය ඉදිරිපත් කර ඇත්තේ සම්මුඛ පරීක්‍ෂණයට පසු දිනක බවත් පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සඳහන් කර ඇති ආකාරයට සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුට අසාධාරණයක් කර නොමැති බවත් සඳහන් කර ඇත.

## කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු

පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනයේ පැවත ඇති ගණකාධිකාරි ii ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනිමේ තරග විභාගයට හා සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි වී ඇති අතර තරග විභාගයෙන් ලකුණු 64ක්ද ඒ අනුව සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි වී ඉන් ලකුණු 16ක්ද උපයාගෙන ඇත.

වගඋත්තරකරුවන් හා පැමිණිලිකරු යන දෙපාර්ශවයන් කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති වාචික හා ලිඛිත දේශන සලකා බැලීමේදී පැමිණිලිකරු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයයේදී ප්‍රශ්නගත වී ඇති එකම කාරණය ලෙස දක්වා ඇත්තේ සම්මුණ පරීක්ෂණයේදී අපේක්ෂකයන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කළ බවත්, පැමිණිලිකරු තම අධ්‍යාපන සහතික අතරින් කැලණිය විශ්ව විද්‍යාලය විසින් නිකුත් කොට ඇති උපාධි සහතිකය ඉදිරිපත් නොකල බවත්, ඒ හේතුවෙන් ඊට අදාලව ලබා දිය යුතු නියමිත ලකුණු ලබාදී නොමැති බවත්ය.

එසේම දෙපාර්ශවය විසින්ම කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති ආකාරයට පැමිණිලිකරු ප්‍රධාන උපාධි සහතිකය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කොට නැති නමුත් ඔහු 2018-09-04 දින දරණ කැලණිය විශ්ව විද්‍යාලය විසින් පැමිණිලිකරුගේ උපාධි සාමාර්ථය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කොට ඇති බව අණාවරණය වී ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු හදාරා ඇති පශ්චාත් උපාධියට අදාල ප්‍රතිඵල ලේඛනය හා උපාධි සහතිකය සහ සහතිකයන් දෙකම කෙරෙහිව දැඩි අවධානයක් යොමු කොට ඇති අතර, ඒ අනුව පැහැදිලිවම පැමිණිලිකරු ලබා ඇති සාමාර්ථයන් දැක්වෙන ප්‍රතිඵල ලේඛනය මගින් පැහැදිලිවම පැමිණිලිකරුට අදාල පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා ඇති බවත්, හදාරා ඇති විෂයන් හා එකී විෂයන් සදහා පැමිණිලිකරු ලබා ඇති සාමාර්ථයන්ද ඇතුළු සම්පූර්ණ අධ්‍යයන වාර්තාවක් බව අනාවරණය වී ඇත. එම ප්‍රතිඵල ලේඛනයේ සදහන් කිසිදු ලිඛිත සාධකයක් තුලින් පැමිණිලිකරුට අදාල පශ්චාත් උපාධිය සාර්ථකව නිම කොට නොමැති බවක් හෝ එකී පශ්චාත් උපාධි සුදුසුකම අහිමි වී ඇති බවට සාක්ෂියක් සටහන්ව නැත. ඉතා ඉහළ ප්‍රතිශතයක් සහිතව පැමිණිලිකරු අදාල ප්‍රශ්චාත් උපාධිය සාර්ථකව නිමකොට නොමැති බවත් හෝ එකී පශ්චාත් උපාධි සුදුසුකම අහිමි වී ඇති බවට සාක්ෂියක් සටහන්ව නැත. ඉතා ඉහළ ප්‍රතිශතයක් සහිතව පැමිණිලිකරු අදාල පශ්චාත් උපාධිය සම්පූර්ණ කොට ඇති බව මාහට තහවුරු කොට ඇති ලේඛනයක් ලෙස කොමිෂන් සභාව හමුවේ අණාවරණය වී ඇත. 2018 මැයි 01 දා පැමිණිලිකරු අදාල සුදුසුකම් සම්පූර්ණ කොට ඇති බවත් හදාරා ඇති සියළුම විෂයන් මොනවාද යන්නත් ලබා ඇති සාමාර්ථයන් මොනවාද යන්නත් ඉතාම පැහැදිලිව අදාල ප්‍රතිඵල ලේඛනයේ සදහන් කොට ඇත. වගඋත්තරකාර පාර්ශවය එකී ප්‍රතිඵල ලේඛණයේ සදහන් කිසිදු අන්තර්ගත කරුණක් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ප්‍රශ්නගත කොට නොමැති අතර දක්වා ඇති එකම කාරණය වන්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අපේක්ෂා කරනු ලැබුවේ උපාධි සහතිකය පමනක් වන බවත්, පැමිණිලිකරු ඉදිරිපත් කොට ඇත්තේ හදාරා ඇති උපාධියට අදාල ප්‍රතිඵල ලේඛනය වන බවත් ඒ හේතුවෙන් ලකුණු ලබාදී නොමැති බවත්ය. සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛණයක් තුලින් කිසියම් උපාධි සහතියක් ඉදිරිපත් කිරිම මගින් වඩාත් විශ්වසනීය සහතික කිරිමක් හා තහවරු කිරිමක් සිදුවන බවත්, උපාධි සහතිකයක් යම්යම් අවස්ථාවලදී යම්යම් හේතු කාරණා මත ප්‍රශ්නගත විය හැකි බවත් එවැනි අවස්ථාවකදී උපාධි සහතිකය වඩාත් විශ්වසනීයත්වය තහවුරු කොට ගැනිම සදහා ඕනැම අධ්‍යයනික හෝ වෘත්තිමය ආයතනයක් මගින්

එකී උපාධි සහතිකයට අදාල සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුට දන්වා සිටිය හැකි බවත් වඩාත් පිළිගත යුතු සහ අවධාරණය කළ යුතු කාරණයකි.

ඒ අනුව සලකා බැලීමේදී පැමිණිලිකරු තමා විසින් සම්පූර්ණ කොට ඇති පශ්චාත් උපාධි පාඨමාලාව ඉතා සාර්ථකව සමත් වී ඇති බවත් එකී සුදුසුකම තමා සතුව පවතින බවත් තහවුරු කොට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කොට ඇති බව නිත්‍යානුකූලව කොමිෂන් සභාව හමුවේ අණාවරණය වී ඇත. ඉදිරිපත්ව ඇති ලේඛනයන්ගේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්නගත කිරීමක් සිදුකොට නොමැත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පදනම් විරහිත ස්ථාවරයක පිහිටමින් පැමිණිලිකරුට ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප කොට ඇති බව නිරීක්ෂණය වේ. අවම වශයෙන් වගඋත්තරකරුවන් විසින් උපාධි සහතිකය පමණක් පිළිගැනීමටත් ප්‍රතිඵල ලේඛනය මගින් අදාල උපාධි සුදුසුකම සපුරා ඇති බව පිළිනොගැනීමට හේතුවක් වගඋත්තරකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කලයුතුය. නමුත් ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයට කොමිෂන් සභාවට සාධාරණ කරුණු දැක්වීමක් සිදුකොට නැත.

සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වී ඇති අයදුම්කරුවන්ගේ ලකුණු සංඛ්‍යාව අනුපිළිවෙලින් 78.4, 67.8, 66.0 වේ. පැමිණිලිකරුට සම්පූර්ණ ලකුණු 64ක් ලබාදී ඇති අතර, පශ්චාත් උපාධි සහතිකය සඳහා ලකුණු 02ක් ලබා දුන්නේ නම් ඔහුගේ මුළු ලකුණු සංඛ්‍යාව 28.2+38.4 = 66.6 ක් වනු ඇත. එසේ සලකා බැලීමේදී සම්මුඛ පරීක්ෂණයෙන් 03වන ස්ථානයට තෝරාගෙන ඇති අපේක්ෂකයාට වඩා මෙම පැමිණිලිකරුට ලකුණු හිමිවන බව නිරීක්ෂණය වී ඇත.

<u>නිර්දේශය</u>

ඉහත සියළු කරුණු සලකා බැලීමේදී වගඋත්තරකරුවන් පැමිණිලිකරු සම්බන්ධයෙන් නිත්‍යානුකූල නොවන ආකාරයෙන් ක්‍රියා කොට ඇති බවත්. පැමිණිලිකරුට හිමිවිය යුතු ලකුණු අහිමි කිරීමට ක්‍රියා කොට ඇති බවත් ඒ හේතුවෙන් ඔහුට ලබා ගැනීමට හිමිකම පැවති ගණකාධිකාරි ii ශ්‍රේණියේ තනතුර අහිමි කොට ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

ඒ අනුව වගඋත්තරකරුගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

ඒ අනුව පැමිණිලිකරුට අදාල ගණකාධිකාරි ii ශ්‍රේණියේ තනතුර නිත්‍යානුකූලව ලබා දීමට කටයුතු කල යුතු බවත් ඉතා කඩිනමින් ප්‍රශ්නගත තනතුරෙහි පැමිණිලිකරු අදාළ දිනට පිහිටවිය යුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලබයි.

2022.07.08 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම් දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු( විශ්‍රාමික)
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

r. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka